**කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතිය - 01 කොටස - 2019**

**-------------------------------------------------------------------------------------**

කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතියේ 01 කොටස 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර 2017 ජනවාරි 17 දින එළඹි අංක 5873 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛණ 02 හි 11 වගන්තියේ ආ.3 සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්‍ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, එවකට ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය වර්තමානයේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ හා කිරීමේ නියෝජිතායතනය වේ. උතුරු, නැගෙනහිර, උතුරු මැද, මධ්‍යම සහ ඌව පළාත්වල කෘෂි ඵලදායීතාවය ඉහළ නැංවීම, වෙළඳපොළ ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ ගොවීන්ගේ හා කෘෂි ව්‍යාපාර මගින් කෙරෙන අගය එකතු කිරීම් වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ආයෝජනයන් සකස් කිරීමේ සහය, ගොවි නිෂ්පාදන සංවිධාන සහ කෘෂි ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන ගැලපුම් දීමනාව ප්‍රධානය,කොටස් වශයෙන් ණය සඳහා ඇපවීම යනාදී සංරචක 3ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. මූල්‍ය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 9,175.88 කට සමාන එජඩො මිලියන 64.87 සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජනවාරි 01 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලැසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගනය කළ මතය

මාගේ වාර්තාවේ2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර , ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | ----------------------- | -------- | ---------------------- | ----------------- |
| (අ) | ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමට ප්‍රතිලාභීන් විසින් කරන ලද දායකත්වය වෙනම හඳුනාගෙන වාර්තා කර නොතිබුණි. | අරමුදල් මූලාශ්‍රවල වටිනාකම අඩුවෙන් දැක්වේ. | එය තුන්වන පාර්ශවයකගේ බැංකු ගනුදෙනුවක් සහ අපගේ පොත්වල ද්විත්ව සටහන් තැබීමට නොහැකි නිසා වර්තමානයේ ප්‍රතිලාභීන්ගේ දායකත්වය ගිණුම්ගත කිරීමට ක්‍රමවේදයක් නොමැත. මෙම ගැටළුව විගණකාධිපති දෙපාර්තමේන්තුව සමග මහා භාණ්ඩාගාරය/මුදල් අමාත්‍යාංශයේ මේ සඳහා ගිණුම්කරන ක්‍රමය | ව්‍යාපෘතිය ප්‍රතිලාභීන්ගේ දායකත්වය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල වෙනම හෙළිදරව් කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | පිළිබඳව ඔවුන්ගේ අදහස් හා මතය විමසා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට පියවර ගනු ලැබේ.අපගේ මතය වන්නේ මෙය වර්තමාන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් ලෙස හෙළිදරව් කල හැකි බවයි. | |
| (ආ) වර්ෂ2018 සිට 2019 දක්වා හැඳි ගැරුප්පු, වතුර වීදුරු, ටී සෙට් සහ නාම පුවරු මිළදී ගැනීමට කරන ලද එකතුව රු.මිලියන 2.01ක් ලීබඩු හා සවිකිරීම් සහ කාර්යාල උපකරණ ගිණුමට වැරදි ලෙස හර කර තිබුණි.එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දේපල පිරියත හා උපකරණ ගිණුමේ වටිනාකම එම මුදලින් වැඩි වී තිබුණි. | එම මුදලින් දේපල පිරියත හා උපකරණ වැඩියෙන් දැක්වේ. | වරද නිවැරදි කිරීමට නිවැරදි ජනල් සටහන යොදා ඇති අතර ඒ අනුව මූල්‍ය ප්‍රකාශනය වෙනස් කර ඇත. | වරද නිවැරදි කිරීමට පියවර ගත යුතුය. | |
| (ඇ) ගිවිසුමේ සඳහන් කටයුතු ඉටුකිරීමට සමාගම් හතරකට රු.මිලියන 19.14ක ගැලපුම් ප්‍රදාන නිදහස් කර තිබුනද ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් පසුව කටයුතු නවතා ඇත. කෙසේවෙතත් මෙම තොරතුරු අසම්භාව්‍ය සිද්ධියක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | අසම්භාව්‍යන්ගේ තත්‍ය තත්ත්වය 2019 දෙසැම්බර් 31 දිනට අනාවරණය කර නොතිබුණි. | අපගේ දැනීමට අනුව ව්‍යාපෘතිය නතර කරන ලද යෝජිතයන් දෙදෙනෙක් පමණක් සිටි අතර නීතිමය සනාථන ලබා ගැනීමෙන් පසු 2020 දී ගිණුම්වල සටහනක් ලෙස අනාවරණය කරනු ලැබේ. | අසම්භාව්‍යන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල මෙම තොරතුරු අනාවරණය කිරීමට පියවර ගත යුතුය. | |

## 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| (අ) | මුදල් අමාත්‍යාංශයේ 2002 නොවැම්බර් 28 දිනැති අයිඒඅයි/2002/02 දරණ චක්‍රලේඛය | රු.මිලියන 9.48ක පිරිවැයකට මිළදීගත් පරිගණක හා උපාංග පරිගණක හා උපාංග ලේඛණයේ වාර්තාකර නොතිබුණි. | ව්‍යාපෘති කාර්යාලයේ නිකුත්කල අයිතමයන් සඳහා වාර්තා නොමැති නිසා ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු සඳහා ලැප්ටොප් සහ අනෙකුත් පරිගණක උපාංග භාවිතා කල නොහැකි අතර වෙනත් අරමුණු සඳහා භාවිතා කිරීමට අවස්ථාව ලබා දේ. | අනෙකුත් වත්කම් සමග සාමාන්‍ය ස්ථාවර වත්කම් ලේඛනයේ විස්තර ඇතුලත් කර ඇති අතර හැකි විගස පරිගණක සහ උපාංග සඳහා වෙනම ලේඛණයක් තබා ගැනීමට පියවර ගනු ලබන අතර 2002 නොවැම්බර්28 දිනැති අයිඒඅයි/2002/02 දරණ චක්‍රලේඛය අනුව වර්තමානයේ වාර්තා යාවත්කාලීන කරමින් පවතී. | චක්‍රලේඛය උපදෙස්වලට අනුගතවීම අවශ්‍ය වේ. |
| (ආ) | 2006 අංක 12 දරණ මුද්දර බදු | වර්ෂ 2017 සිට වාර්තා කරන | රජයේ ආදායම අඩු වේ. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වගකීම නිවැරදි | පනතේ විධිවිධානවලට |

| | | | | |
|---|---|---|---|---|
| පනත | දිනට සේවකයින්ගේ වැටුපෙන් අඩුකර ගන්නා ලද රු.25,475ක උපචිත මුද්දර බද්ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල ගෙවියයුතු ලෙස ඉදිරියට ගෙන තිබුණි. | | අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත නියෝජනයන් කිහිපයක් යවා ඇත. කෙසේවෙතත් රේඛීය අමාත්‍යාංශය සඳහා මුද්දර බදු ගෙවීම සඳහා ගොනුවක් නොතිබුණු නිසා ව්‍යාපෘතියේ ගෙවීම් භාරගෙන නොමැත. ව්‍යාපෘතිය සඳහා වෙනම ගොනුවක් විවෘත කිරීමට පියවර ගන්නා අතර එය 2020 වර්ෂයේ දී ප්‍රේෂණය කිරීමට පියවර ගන්නා අතර ඒ අනුව අඛණ්ඩව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ. | වලට අනුගත වීම අවශ්‍ය වේ. |

**3.** **භෞතික කාර්යසාධනය**

**3.1** **ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

ව්‍යාපෘතියේ කටයුතු සංරචක 3ක් යටතේ ක්‍රියාත්මක වේ.

(අ) ආයෝජනයන් සකස් කිරීමේ සහය
(ආ) ගොවි නිෂ්පාදන සංවිධාන සහ කෘෂි ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන ගැලපුම් දීමනාව ප්‍රධානය
(ඇ) කොටස් වශයෙන් ණය සඳහා ඇපවීම.

| සංරචකයන් | විගණන ගැටළු | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) ප්‍රාග්ධන ගැලපුම් දීමනාව ලබා දීම | (i) ඉහල දුරිද්‍රතාවයෙන් යුත් පිරිසක් සිටින ප්‍රදේශ ලෙස වෙන්කරන ලද යාපනය, මුලතිවු, අනුරාධපුර, මඩකලපුව, මොනරාගල, මාතලේ සහ පොළොන්නරුව යන ප්‍රමුඛ දිස්ත්‍රික 07 ක ආසන්න වශයෙන් කෘෂි නිෂ්පාදන සංවිධාන 350 සහය දැක්වීම ප්‍රාග්ධන ප්‍රදාන වැඩසටහනෙන් අපේක්ෂා කෙරේ. කෙසේවෙතත් ව්‍යාපෘතිය ප්‍රාග්ධන ප්‍රදාන ලබාදීම සඳහා කොළඹ, ගම්පහ, කළුතර, කුරුණෑගල ඇතුළුව වෙනත් දිස්ත්‍රික්ක 15 ක් තොරාගෙන තිබුණි. මුළු ප්‍රදානයන්ගෙන් ඉහත සඳහන් කල දිස්ත්‍රික්ක 15 සඳහා සියයට 86.6 ක් වෙන්කර තිබුණි. | තෝරාගත් ප්‍රදේශවල ඉහල දරිද්‍රතාවයෙන් යුත් කණ්ඩායම් ජීවත්වන නිසා ව්‍යපෘති ඇගයුම් ලේඛණයෙන් හදුගත් ගොවීන් වෙත ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. | ප්‍රමුඛ දිස්ත්‍රික්ක 07 තුළ 2017සහ 2018 කැදවන ලද 1 හා 2 වන EOI වලට ප්‍රතිචාරවලදී විශාල පරිමාණයේ ආයෝජනයන් සහිත ශක්‍ය ව්‍යාපෘති ආරම්භයේදී නොතිබුණි. වර්තමානයේ ව්‍යාපෘති කළමණාකරණ ඒකකය මෙම ප්‍රමුඛ දිස්ත්‍රික්ක 07 තුළ වැඩි වශයෙන් දැනුවත් කිරීම් සිදුකරන අතර මෙම දිස්ත්‍රික්කවල අනාගත ආයෝජකයින් හදුනාගැනීමට ප්‍රචාරය කිරීම සඳහා මණ්ඩලයේ සාමාජිකයන් වන ඉහත දිස්ත්‍රික්කවල පළාත් ලේකම්වරුන්ට උපදෙස් ලබාදී ඇත. දැනටමත් ආයෝජකයින් කිහිපදෙනෙකු සිටි. | ව්‍යාපෘතියේ අරමුණු ලගාකර ගැනීමේ අරමුණින් ව්‍යාපෘතියේ කටයුතු නියාමනය කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) ව්‍යාපෘතිය 2019 දෙසැම්බර් 31 දින දක්වා යෝජිත සමාගම් 37ක් සඳහා ප්‍රාග්ධන ගැලපුම් දීමනාව ලෙස එකතුව රු.මිලියන 540.32ක් අනුමතකර තිබුනද අනුමත දිනයේ සිට මාස 06 සිට මාස 24 දක්වා කාලයක් අවසන් වුවද ප්‍රාග්ධන ගැලපුම් දීමනාව නිදහස් කර නොතිබුණි. | ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුලදී යෝජිත සමාගම් සඳහා වෙන් කරන ලද අරමුදල් ප්‍රදානය කිරීමට ව්‍යාපෘතියට නොහැකිවේ. එහි ප්‍රතිඵලයක් ලෙස වියපැහැදම් නොවූ අරමුදල් මත මහා භාණ්ඩාගාරයට ලෝක බැංකුව වෙත බැඳීම් ගාස්තු ගෙවීමට සිදු වේ. | යෝජිත සමාගම්වලට බැංකුව මගින් දෙනු ලබන වාණිජ ණය සහ ඔවුන්ගේ දායකත්වය පෙන්වීමට නොහැකිවීම හේතුවෙන් මෙය සිදුවී ඇත. සියළුම නීතිමය ලියකියවිලි සපයා නොමැති නිසා ප්‍රදාන ගිවිසුම් අත්සන් කල නොහැකි අතර මෙය ව්‍යාපෘති කළමණාකරන ඒකකයේ පාලනයෙන් බැහැර දෙයක් වේ. | ව්‍යාපෘතියේ අරමුණු ලගාකර ගැනීමේ අරමුණින් ව්‍යාපෘතියේ කටයුතු නියාමනය කිරීමට පියවර ගත යුතුය. |
| (iii) රැස්කරන ලද තොරතුරුවලට අනුව ව්‍යාපෘතිය 2019 මාර්තු 31 දිනට යෝජිත සමාගම් 3ක් සඳහා පළමු පියවර යටතේ රු.මිලියන 14.63ක් වටිනා ප්‍රාග්ධන ගැලපුම් දීමනාව ප්‍රදානය කර තිබුණි.කෙසේ වෙතත් 2019 වර්ෂය අවසානය වන තෙක් යෝජිත සමාගම් සඳහා දෙවැනි කොටස ලබා දී නොතිබුණි. | ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුලදී යෝජිත සමාගම් සඳහා වෙන් කරන ලද අරමුදල් ප්‍රදානය කිරීමට ව්‍යාපෘතියට නොහැකිවේ. එහි ප්‍රතිඵලයක් ලෙස වියපැහැදම් නොවූ අරමුදල් මත මහා භාණ්ඩාගාරයට ලෝක බැංකුව වෙත බැඳීම් ගාස්තු ගෙවීමට සිදු වේ. | මෙය ප්‍රධාන වශයෙන් ව්‍යාපෘතියේ ස්වභාවය නිසා සිදුවී තිබේ. ව්‍යාපෘතිවල විවිධ කාලපරිච්ඡේදයන් හේතුවෙන් ව්‍යාපෘතියේ පළමු වාරිකයේ වැඩ ප්‍රගතිය මත දෙවන වාරිකය නිදහස් කිරීම වෙනස් වේ. තවද ගැලපුම් දීමනා ප්‍රතිශතය සම්පූර්ණ වන තෙක් මුදල් නිදහස් නොකෙරේ. මෙය ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීමෙ ආරම්භක සැලැස්ම අපේක්ෂිත කාලයට වඩා වැඩි කාලයක් ගෙන තිබීම හේතුවෙන් වේ. | ව්‍යාපෘතියේ අරමුණු ලගාකර ගැනීමේ අරමුණින් ව්‍යාපෘතියේ කටයුතු නියාමනය කිරීමට පියවර ගත යුතුය. |
| (iv) ව්‍යාපෘති ඇගයුම් ලේඛණයේ ඇමුණුම 2හි 8(ආ) vi වගන්තියට අනුව ආයෝජන යෝජනාව සහ ප්‍රාග්ධන ගැලපුම් දීමනාව අවුරුදු 2ක් 3ක් නොඉක්මවන කාලයක් පුරා ක්‍රියාත්මක කල යුතුය. කෙසේ වෙතත් 2017 සහ 2018 වර්ෂ වලදී රු.මිලියන 1,500.25 වටිනා අනුමත කරන ලද ප්‍රාග්ධන ගැලපුම් දීමනා 2019 වර්ෂය අවසානය වන විටදී ආයෝජන කටයුතු නිමකර නොතිබුණි. | ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුලදී යෝජිත සමාගම් සඳහා වෙන් කරන ලද අරමුදල් ප්‍රදානය කිරීමට ව්‍යාපෘතියට නොහැකිවේ. එහි ප්‍රතිඵලයක් ලෙස වියපැහැදම් නොවූ අරමුදල් මත මහා භාණ්ඩාගාරයට ලෝක බැංකුව වෙත බැඳීම් ගාස්තු ගෙවීමට සිදු වේ. | මෙය ආයෝජනයේ ප්‍රමාණය මත වෙනස් විය හැක.තමන් යොදන අරමුදල් හා බැංකු ණය සහ EPL/රජයේ ව්‍යවස්ථාපිත අනුමැතිය, ඉඩම් නිරවුල් කිරීම යනාදිය නීතිමය ලියවිලි නොමැති වීම හේතුවෙන් යොමුගත ව්‍යාපෘතිය ගිවිසුම් අත්සන් කිරීමේ අදියර වෙත ලගා වී නොමැත.ව්‍යාපෘති ඇගයීම් ලේඛණයට අනුව ව්‍යාපෘති වර්ෂ 2ක් 3ක් තුල නිමකල යුතුය. කෙසේවෙතත් මෙම අනුමත ව්‍යාපෘති ඉහත සඳහන් කල හේතු නිසා ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු ලගාකර ගැනීමේ අරමුණින් ව්‍යාපෘතියේ කටයුතු නියාමනය කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (v) ප්‍රාග්ධන ගැලපුම් දීමනා යෝජනා ක්‍රමයේ මෙහෙයුම් අත්පොතෙහි 8.5 වගන්තියට අනුව ව්‍යාපෘති කළමණාකරන ඒකකය ගැටළු සහිත ව්‍යාපෘති ලේඛණයක් නඩත්තු කල යුතු අතර කලින් කලට එය යාවත්කාලීන කලයුතු වුවත් ගැටළු සහිත ව්‍යාපෘති ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. තවද විගණනයේදී සිදුකරන ලද අහඹු පරීක්ෂාවකදී ව්‍යාපෘති කටයුතු නතර කරන ලද සමාගම් 4ක් සඳහා 2017 සහ 2018 වර්ෂවලදී රු.මිලියන 19.14ක් ප්‍රාග්ධන ගැලපුම් දීමනා ලබා දී තිබුණු අතර ඉන් රු.මිලියන 1.35ක් පමණක් ආපසු ගෙවා තිබුණු බව අනාවරණය විය. මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුලදී ව්‍යාපෘතිය විසින් ඉතිරි මුදල වු රු.මිලියන 17.79 ක මුදල අයකර ගැනීමට සමාගමට එරෙහිව නීතිමය පියවර ගැනීමටකටයුතු සිදුකර නොතිබුණි. | ණය අරමුදල් නාස්තියක්වන අතර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වේ. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නිරීක්ෂනය කරන අතර නියාමනය සහ ඇගයීම් විශේෂඥයින් ලේඛනයක් නඩත්තුකර ඇත. | තත්ත්වය නිවැරදි කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වන අතර ප්‍රාග්ධන ගැලපුම් දීමනා ගිවිසුම් අනුව ඉක්මන් පියවර ගත යුතුය. |
| (ආ) ණය සඳහා කොටසකට ඇප වීම | 2019 මාර්තු 31දක්වා ව්‍යාපෘතියේ ණය සඳහා කොටසකට ඇප වීම සංරචකය යටතේ කටයුතු කිරීමට වෙන් කරන ලද රු.මිලියන 7.12ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. ව්‍යාපෘති කළමනාකරු කරන ලද විස්තර කිරීම් වලට අනුව බලපත්‍රලාභී වාණිජ බැංකුවල නියෝජිතයින් සමග දැනුවත් කිරීමේ වැඩ සටහන් කිහිපයක් පවත්වා තිබුණු අතර පරිපාලන කටයුතු වලදී මුහුණ දෙන ලද ගැටළු හේතුවෙන් අදාල බැංකු විසින් ආරම්භ කිරීමට පියවර ගෙන නොතිබුණි. | යෝජිත සමාගම් වල ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම බලපානු ලැබේ. | ණය සඳහා කොටසකට ඇප වීම පිළිබඳව විගණනයේ අදහස නිවැරදි වන අතර පිළිගනු ලැබේ. | මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පෞද්ගලික බැංකුවල සහාය ලබා ගැනීමට පියවර ගතයුතුය. |

## 3.2 වැඩබිම පරීක්ෂාවේදී කරන ලද නිරීක්ෂණ

| විගණන ගැටළුව | බලපෑම | කළමණාකරනයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| යෝජිත සමාගම් 13ක ප්‍රගතිය සියළුම කටයුතු වලින් අපේක්ෂිත මට්ටමින් නොපැවතුනු බව විගණනයේදී සිදු කරන ලද අහඹු පරීක්ෂාවේදී අනාවරණය විය. කෙසේවෙතත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටදී මෙම සමාගම් සඳහා ප්‍රාග්ධන ගැලපුම් දීමනාව ලෙස එකතුව රු.මිලියන 134.73ක් නිදහස් කර තිබුණි. | ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුලදී අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වේ. | සැලසුම් කල ක්‍රියාත්මක කිරීමේ ලේඛණයෙන් සමහර කටයුතු ප්‍රමාදයන් සිදුවී ඇති බව අපට දැනගන්නට ලැබුණි. උදාහරණ ලෙස ඉදිකිරීම්, යන්ත්‍ර ස්ථාපනයට තාක්ෂණය යොදා ගැනීම. ක්ෂේත්‍ර වාර්තා පදනම් කරගෙන තවදුටත් පැහැදිලි කර ගැනීමට මෙම යෝජිත සමාගම් 13හි විස්තර ඉල්ලා ඇති අතර වර්තමාන තත්ත්වය යාවත්කාලීන කිරීමට නියාමන ඇගයුම් වාර්තා ඉල්ලා ඇත. | තත්ත්වය නිවැරදි කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වන අතර ප්‍රාග්ධන ගැලපුම් දීමනා ගිවිසුම් අනුව ඉක්මන් පියවර ගත යුතුය. |

## 3.3 ඌන උපයෝජිත සම්පත්

| | විගණන ගැටළු | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- | --- |
| (අ) | ව්‍යාපෘතියේ කටයුතු ආරම්භකර වර්ෂ 3ක් ගතවීමෙන් පසු 2019 දෙසැම්බර් 31 දිනට ණය නියෝජිත ආයතනය විසින් කරනලද රු.මිලියන 8,869.38 කට සමාන එජඩො මිලියන 60.77 මුළු වෙන් කිරීමෙන් සියයට 21.54 ක් නියෝජනය කරන එකතුව රු.මිලියන 2,135.42කට සමාන එජඩො මිලියන 13.09 ක් පමණක් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. | අපේක්ෂිත අරමුණු අත්කර ගෙන නොතිබුණි. | 2019 මාර්තු 31 දක්වා ගන්නා ලද රු.මිලියන2,135.42ක අරමුදල් සම්බන්ධයෙන් එකග වේ. කෙසේවෙතත් සංරචක 1 සඳහා මුළු ප්‍රතිපාදනය එජඩො මිලියන 60.77ක් නොව එජඩො මිලියන 58.63 ක් විය යුතු අතර M&E සඳහා ප්‍රතිපාදනය සංරචක 2 සමග බෙදාගත යුතුය. ක්‍රියාත්මක කිරීමේ උපලේඛණයට අනුව සඳහන් කාලයේදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යෝජිත සමාගම් සඳහා නොහැකිවීම නිසා වෙන් කරන ලද අරමුදල් භාවිතයේ ප්‍රතිශතය අඩුවන අතර එමගින් ප්‍රදානයන් ලබා දීම කාලය ගතවවී තිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු ලගාකර ගැනීමේ අරමුණින් ව්‍යාපෘතියේ කටයුතු නියාමනය කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2017 වර්ෂයේදී රු.මිලියන 4.25 ක පිරිවැයකට ව්‍යාපෘතිය විසින් මිළදී ගන්නා ලද වෙබ් අඩවි පදනම් කරගත් GIS මෘදුකාංගය පසුගිය වර්ෂ 3 පුරා අපේක්ෂිත අරමුණු සඳහා | අපේක්ෂිත අරමුණු අත්කර ගෙන නොතිබුණි. | අවශ්‍ය කාර්යය සිදු කිරීමට අවශ්‍ය සුදුසුකම් සහිත සුදුසු පුද්ගලයෙකු සොයා ගැනීමට අපහසු වීමනිසා GIS සඳහා සුදුසු උපදේශකවරයෙකු බඳවා | තත්ත්වය නිවැරදි කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | භාවිතා කර නොතිබුණි. | | ගැනීමේ ප්‍රමාදයක් සිදු වූ අතර 2019 අගෝස්තු 28 දින බඳවා ගන්නා ලද නවඋපදේශක විසින් වර්තමානයේ මෘදුකාංගය උපරිම ලෙස භාවිතා කෙරේ. | |

## 3.4 පරිබාහිර කටයුතු

| | විගණන ගැටළුව | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| | --------------------- | ---------- | ------------------- | -------------------- |
| (අ) | ව්‍යාපෘතියේ අරමුණුවලට පටහැනිව අපනයන ගම්මාන 5000 ක් පිහිටුවීමට පියවර ගෙන ඇත. ආරම්භක පියවර වශයෙන් වැඩසටහනේ කටයුතු ආරම්භ කිරීම මත රු. මිලියන 4.24ක පිරිවැයක් දරා 2019 ජුනි 17 දින දෙහිඅත්තකන්ඩියේදී දිවයින පුරා අපනයන ගම්මාන 1000 ක් පිහිටුවීමේ වැඩසටහන ආරම්භ කර තිබුණි. | මහජන මුදල් නාස්තිවීම හා අපේක්ෂත අරමුණු ලගා කරගත නොහැකි වේ. | අපනයන ගම්මාන පිහිටුවීම එවකට සමාජ සවිබල ගැන්වීම හා අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සිදු කරන ලද වැඩසටහනක් වේ. බොහෝ ව්‍යවසායකයන් හවුල් ව්‍යාපාර ගොඩනැගීමට එම අවස්ථාවට එක්වන නිසා ඒ අතරතුර ඒඑස්එම්පී සුදුසු ආයෝජකයින් හඳුනාගැනීමට දැනුවත් කිරීම සිදුකිරීමට අවස්ථාව ලබා ගන්නා ලදී. | ව්‍යාපෘතියේ අරමුණු අනුව කටයුතු කල යුතු අතර ව්‍යාපෘතියේ මෙහෙයුම් පිරිවැය අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ අරමුණුවලට පටහැනිව ප්‍රාග්ධන ගැලපුම් දිමනාව හිමි ප්‍රතිලාභීන්ගේ ගොඩනැගිලිවල නාම පුවරු සවි කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීමට 2019 දෙසැම්බර් 31 අවසානයේදී එකතුව රු.මිලියන 2.16ක් දරා තිබුණි. | මහජන මුදල් නාස්තිවීම හා අපේක්ෂිත අරමුණු ලගා කරගත නොහැකි වේ. | ලෝක බැංකුවේ ව්‍යාපෘති ඇගයුම් ලේඛණය අනුව දුක්ගැනවිලි නැවත යොමුකිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා මෙය සිදු කරන ලදී. නාම පුවරු අදාල ව්‍යාපෘති රජය විසින් අනුමත කර ඇති අතර සියළුම ප්‍රමිති සම්පූර්ණ කර නීතිමය වශයෙන් ශක්‍යතාව යෙන් යුතු බව මහජනතාව වෙත දැන්වීමේ ක්‍රමයක් වේ.මෙය සිදුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස අවට ප්‍රදේශවල පදිංචිකරුවන්ට මුහුණ දෙන දුක්ගැනවිලි ඍජුවම අමාත්‍යාංශය වෙත යොමු කිරීමට හැකිවී තිබේ. | ව්‍යාපෘතියේ අරමුණු අනුව කටයුතු කල යුතු අතර ව්‍යාපෘතියේ මෙහෙයුම් පිරිවැය අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | කෘෂි නිෂ්පාද වලට අගය එකතු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වුවද එළුවන් මිළදී සඳහා රු.මිලියන 3.4ක් ආර්ථික නොවන වියදමක් දරා ගොවීන් අතර බෙදාහැර තිබුණි. | ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුලදී අපේක්ෂිත අරමුණු ලගාකර ගැනීමට නොහැකි වේ. | පාංශු අංශයේ අගය දාම සංවර්ධනයේ පරතරය හඳුනා ගත්විට පශු සම්පත් හා සත්ව පාලනයේ විශාල පරතරයක් පවතින බව අනාවරණය විය. ගොවිතැන් යනු වටිනාකම් දාමයේ ඉහළ ප්‍රවාහය වන | ව්‍යාපෘතියේ අරමුණු අනුව කල යුතු අතර ව්‍යාපෘතියේ මෙහෙයුම් පිරිවැය අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

අතර මෙම පරතරය පියවීම සඳහා ඉහත සඳහන් ව්‍යාපෘතිය සිදුකර ඇත. මෙය එක් වතාවක් සිදුකරන කටයුත්තකි. මෙම නියමු ව්‍යාපෘතියේ ප්‍රතිඵලය එවැනි නියමු ව්‍යාපෘති අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳ තීරණ ගැනීමට බලධාරීන්ට උපකාරී වේ.